# දෙවන වාර විභාගය - බුද්ධාගම

## 4 ශ්‍රේණිය

ලකුණු

නම : ..............................................................

කාලය : පැය 1 මිනිත්තු 15

**01. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. සිදුහත් කුමරු ගිහි ගෙය හැර ගියේ,
   1. ඇසළ පෝය දින 2. වෙසක් පෝය දින 3. පොසොන් පෝය දින

2. බෝසතාණන් වහන්සේට කිරිපිඩු පූජා කළේ,
   1. විශාඛා සිටු දුව 2. සුජාතා සිටු දුව 3. මන්තානි බැමිණිය

3. සිදුහත් කුමරු ඉපදී දින හතකින් කලුරිය කළේ,
   1. විහාර මහා දේවිය 2. ප්‍රජාපති ගෝතමී දේවිය 3. මහමායා දේවිය

4. සැරියුත් මහ රහතන් වහන්සේගේ ගිහි කළ නම වූයේ,
   1. උපතිස්ස 2. මුගලන් 3. අස්සජි

5. පූජා බුද්ධියෙන් දානය ලබා දිය හැකි පිරිසකි.
   1. සංඝයා වහන්සේලා
   2. ළමා නිවාසවල ළමයින්
   3. වැඩිහිටි නිවාසවල වැඩිහිටියන්

6. උපතිස්ස කෝලිත මිතුරන් දෙදෙනා නැරඹීමට ගිය උත්සවය වන්නේ,
   1. වේදිකා නාට්‍ය 2. ගිරග්ග සමජ්ජ 3. පෙරහැර

(ලකුණු 1 × 6 = 6)

**02. පහත සඳහන් වගන්තිවලින් කියැවෙන දේ හරි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද යොදන්න.**

1. උපතිස්ස පිරිවැජියා අස්සජි හිමිගෙන් බණ ඇසුවා. ( )
2. හොඳ මිතුරා විපතේ දී මිතුරාව මඟ හරිනවා. ( )
3. සිදුහත් කුමරු ඡන්න ඇමති සමඟ උයනට ගියා. ( )
4. සිදුහත් කුමරුට සිවුරු පිරිකර පූජා කළේ මහා බ්‍රහ්මයායි. ( )
5. සොත්ථිය බමුණා බෝසතාණන් වහන්සේට කුසතණ මිටි අටක් පූජා කළා. ( )

6. මහා ප්‍රජාපතී ගෝතමී මහ රහත් තෙරණියෝ අවුරුදු එකසිය විස්සක් ජීවත් වුණා. ( )

7. වැඩිහිටියන්ට සැලකීම හොඳ ගුණාංගයක් නොවේ. ( )

8. බෝසතාණෝ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කර ගත්තා. ( )

9. බුදුන් වහන්සේ පූතිගත්ත තිස්ස තෙරුන්ට උපකාර කළා. ( )

10. කිසා ගෝතමිය පොහොසත් පවුලක දියණියක්. ( )

(ලකුණු 2 × 10 = 20)

## 03. නිවැරදි පිළිතුර සොයා යා කරන්න.

| | |
|---|---|
| 1. චව් චව්, සුරු සුරු ශබ්ද නැගීම | බුද්ධ මාතා නම් විය |
| 2. ඇස් අඳ දෙමාපියන්ට සැලකුවේ | දීඝායු කුමාරයා |
| 3. ප්‍රජාපති ගෝතමී දේවිය | ආහාර ගැනීමේ දී නොකළ යුතුයි |
| 4. අවුරුදු 120 ජීවත් වුණා | වෙසක් පෝය දා |
| 5. තෙමඟුල සිදු වූයේ | සාම කුමාරයා |

(ලකුණු 1 × 5 = 5)

## 04. හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(ත්‍රිවිද්‍යා / රාහුල / නන්ද / කන්ථක / අඛ)

1. ......................................... අසු පිට නැගී සිදුහත් කුමරු ගිහිගෙය අත හැර ගියා.

2. ප්‍රජාපතී ගෝතමී දේවියගේ පුත්‍රයා වූයේ ........................................... කුමාරයායි.

3. යසෝදරා දේවියට ලැබුණු කුමාරයාගේ නම .................................... කුමාරයායි.

4. බෝසතාණන් වහන්සේ සිත සමාධිගත කර ගනිමින් ........................................... උපදවා ගත්තා.

5. කිසා ගෝතමිය ........................................... සොයා ගෙන ගෙයින් ගෙට ගියා.

(ලකුණු 1 × 5 = 5)

**05. කවිවල හිස්තැන් සම්පූර්ණ කරන්න.**

1. සම්මා සම්බුදු පියා

..................................................................

..................................................................

පෑවා කරුණා දයා

2. සෙත්සිරි දෙන මහ ගුණ මුහුදාණන්

..................................................................

තිත් ගණඳුරු දුරලන දිනිදාණන්

..................................................................

3. හරි වැරදි පෙන්නා

..................................................................

..................................................................

එක ම දෙවියා ගුරු ම වන්නා

(ලකුණු 2 × 6 = 12)

**06. පිළිතුරු සපයන්න.**

1. පස්වග මහණුන්ගේ නම් ලියන්න.

1. .................................. 2. .................................. 3. ..................................

4. .................................. 5. ..................................

2. සතර පෙරනිමිති පිළිවෙළින් ලියන්න.

1. .......................................................... 2. ..........................................................

3. .......................................................... 4. ..........................................................

3. පන්සලේ දී වන්දනාවට පෙර කළ යුතු වතාවත් 3 ක් ලියන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

3. ..............................................................................................................

4. පිදිය යුත්තන් දෙදෙනෙකු නම් කරන්න.

1. ................................................ 2. ................................................

5. අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා නම් කරන්න.

1. ................................................ 2. ................................................

6. මෛත්‍රී භාවනාව වැඩීමෙන් අපට ලැබෙන දේවල් දෙකක් ලියන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

7. සත්‍ය සොයා යන ගමනේ දී සිදුහත් තවුසාණන්ට හමු වූ අය කවුද?

1. ........................................ 2. ........................................

3. ........................................

8. නිවැරදි ආහාර පුරුදු 3 ක් ලියන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

3. ..............................................................................................................

9. හොඳ මිතුරෙකු සතු ලක්ෂණ 3 ක් ලියන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

(ලකුණු 2 × 26 = 52)

WWW.PastPapers.WIKI

Explore pastpapers.wiki for an extensive collection of Past papers, Notes and much more!